# බෞද්ධාලෝකය

ඊ පුවත්පත

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

ශ්‍රී බුද්ධ වර්ෂ 2565
පොසොන් මස 24 වන බ්‍රහස්පතින්දා දින



බෞද්ධාලෝකය

**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය**

අංක 380. බෞද්ධාලෝක මාවත. කොළඹ 7.
දුරකථනය ( 0112691695 / 011 2688517 / 011 2667017)
ෆැක්ස් ( 011 2688517)
web : www.acbc.lk
E-mail : acbc380@gmail.com

## බෞද්ධාලෝක ඊ පුවත්පත පොසොන්කලාපය

1958 ආරම්භ කරන්නට යෙදුන බෞද්ධාලෝක පුවත්පත වසර 10 කට පසු රජයෙන් සැපයූ මුදල් නිසිපරිදි නොලැබීම හේතුවෙන් නවතාදැමීමට සිදුවූ බව බොදුසමුළු ඉතිහාසය අනුව පෙනීයයි. පසුව ඒ වෙනුවට බොදුසමුළුවේ මූල්‍ය දායකත්වයෙන් බෞද්ධාලෝකය සඟරාවක් වශයෙන් 1967 සිට ආරම්භකර මේ දක්වා පවත්වාගෙනයනු ලබයි. ආරම්භයේ හොදින් පවත්වාගෙන ගිය බෞද්ධාලෝක පුවත්පත නැවත වතාවක් ආරම්භ කිරීමට වර්ථමාන බෞද්ධ මහාසම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා එවකට නියෝජ්‍ය සභාපතිවරයා වශයෙන් 2019 වර්ෂයේ කටයුතු කරනු ලැබීය. පොසොන් පොහොය දින නිමිත්තෙන් දිනමිණ පුවත්පතේ පොහෝදින අතිරික්කයක් වශයෙන් පලකිරීමට කටයුතු කරන ලදී. එය සම්මේලනයට සියවසක් සපිරෙන අවස්ථාවේදී සිදුකිරීමට ලැබීම භාග්‍යක්විය. කෙසේවෙතත් පවතින කෝවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ඇති අභියෝග හඳුනා ගනිමින් හා එයට මුහුණ දෙමින් නිවසේ ගතකරනු ලබන කාලයේ ඉලෙක්ට්‍රෝනික මෙවලම් හරහා බෞද්ධ ජනතාවට ඊ පුවත්පතක් ලෙස සිංහල බෞද්ධ ජනතාවට ඉතාමත්වැදගත් පොසොන් පොහෝ දින නිකුත් කිරීමට හැකියාව ලැබීම පිළිබඳව මේ අවස්ථාවේදී සතුටට පත්වන්නෙමු.

# සෝවාන් මාර්ගඵලය

**නාලක ජයසේන**

සියලු බුදුවරු ලොව පහළ වී දේශනා කරන්නේ, එම බුද්ධ කාලය තුළ පෙර නොඇසූවිරූ දහමකි. උන්වහන්සේලා ගුරුඋපදේශයකින් තොරව අවබෝධ කරගන්නා එම දහම වන්නේ, චතුරාර්ය සත්‍ය ධර්මයයි. චතුරාර්ය සත්‍ය ධර්මය යනු, සංසාරයේ ස්වභාවය වූ දුකත්, ඊට හේතුවත්, එම හේතුව නැතිවීමත් හා එම හේතුව නැති වීමේ මාර්ගයත් යන සතරයි. බුදුහිමි දේශනා කළ එම විශ්වයේ සනාතනික ධර්මතාව අවබෝධ කරගැනීමට තම සිත-ගත යොමු කරන කවරකු හෝ බුදුමග වඩන උතුමෙකු වෙයි. කෙනෙකු හට මෙම සිව්සස් දහම අවබෝධ වීම, අදියර තුනකින් සිදු වෙයි. එනම් සත්‍ය ඥාණ, කෘත්‍ය ඥාණ හා කෘත ඥාණ වශයෙන් ඒ ඒ පුද්ගල මනස විසින් දහම දැකීමෙනි සත්‍ය ඥාණය කෙනෙකු තුළ උපදින්නේ ඔහු හෝ ඇය සෝවාන් හෙවත් සෝතාපන්න ඵලය (TREAM WINNER) ප්‍රත්‍යක්ෂ කිරීමෙනි.



මෙම කෙටි ලිපියෙන් සෝතාපන්න ඵලයට පත්වන්නේ කෙසේදැයි කෙටියෙන් සාකච්ඡා කරමු. අපගේ එදිනෙදා ජීවන චර්යාව යනු, අප සතුව ඇති ඉන්ද්‍රියයන්ගෙන් අරමුණු ලබා ගනිමින් ඒවා සමග ප්‍රතික්‍රියා කිරීමයි. ඇස, කන, දිව, නාසය, කය හා මනස යන ඉන්ද්‍රිය හයෙන් රූප, ශබ්ද, ගන්ධ, රස, පහස හා අරමුණු ගනිමින් ඒවා හා විටෙක ඇලෙමින්, තවත් විටෙක ගැටෙමින් ඒවාට මුලා වෙමින් සිටීම ජීවිතයයි. එහෙත් එලෙස ජීවත් වීම ගැන සිහිනුවණෙන් විමසන්නකු හට එලෙස ජීවත්වීමේ ප්‍රතිඵලය කුමක්දැයි සිතෙනු ඇත. එවිට එසේ ජීවත් වීම යනු, හුදෙක්

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

ජාතික ප්‍රචාරක මණ්ඩලයෙන් ප්‍රකාශයට පත්වන,

**බෞද්ධාලෝකය පුවත්පත**
**සහ**
**බෞද්ධාලෝකය සඟරාවට**

ජාතික සමාජ සේවා මණ්ඩලයෙන්
**සුභ පැතුම්!**

## නව නිලධාරී මණ්ඩලය

ගරු සභාපති - චන්ද්‍ර නිමල්වාකිෂ්ඨ මහතා

හිටපු ගරු සභාපති- ජගත් සුමතිපාල මහතා

ගරු නියෝජ්‍යසභාපති- මද්දුමගේ රොෂාන් සම්පත් පෙරේරා මහතා

ගරු සමලේකම්වරු
- තුෂාර දිලුම්වාහලතන්ත්‍රී මහතා
- ඉෂාන් බුද්ධික එදිරිසූරිය මහතා

ගරු භාණ්ඩාගාරික
- ජෙනරාල් ආර්.එම්.ඩී.රත්නායක මහතා

බෞද්ධාලෝකය

ගරු උපසභාපතිවරු
- වෛද්‍ය රාණි ප්‍රනාන්දුමහත්මිය
- වසන්ත ද සිල්වා මහතා
- රියර් අද්මිරාල් ආනන්ද පීරිස් මහතා
- නිලීකා සේනානායක මහත්මිය
- ආනන්ද ලක්ෂ්මන් කෝට්ටගේ මහතා
- විද්‍යාජෝති මහාචාර්ය නිමල් ද සිල්වාමහතා
- උපුල් රූපසිංහ මහතා
- මහාචාර්ය සුසිරිපාල මාලිම්බඩ මහතා
- ලලීන්ද්‍ර රණවීර මහතා
- ආචාර්ය එල්.එම්.කේ.තිලකරත්න මහතා

ගරු උපලේකම්වරු
- එඩ්මන්ඩ් වික්රවමසිංහ මහතා
- එච්. රවි පීරිස් මහතා

සංස්කාරක මණ්ඩලය
- මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර
- වෛද්‍ය රාණී ප්‍රනාන්දු
- ඉෂාන් බුද්ධික එදිරිසූරිය
- ආචාර්ය අශෝක කරුණාරත්න
- නාලක ජයසේන
- ශ්‍යාම් නුවන් ගනේවත්ත

පිටු සැකසුම
- කවිදු රන්දිමාල් ද අල්විස්

# බෞද්ධාලෝකය

සොබාදහමේ චක්‍රයට හසුවීමක් බවත්, එය වෙහෙසකර හා අනර්ථකාරී එකක් බවත් ඔහු හෝ ඇය වටහා ගනු ඇත. නමුත් එසේ සිතීමෙන් පමණක් එම හිස් ගමනෙන් මිදීමට කිසිවකුට නොහැකිය. එයින් මිදීමට නම් එලෙස මිදුණු අයෙකුගේ අවවාද අනුශාසනා ලබාගත යුතු බව ඔහුට ඇයට වැටහෙනු ඇත. ජීවිතයේ දුක් මාවතෙන් මිදී විමුක්තිය සොයා ගිය බුද්ධ ශ්‍රාවකයන් ඔහුට ඇයට පිහිටට එන්නේ ඒ අවස්ථාවේදීය. එයට අපි කල්‍යාණ මිත්‍ර සම්පත්තිය හෙවත් සත්පුරුෂ සේවනය නිසා ලැබෙන සදහම් ඇසුම යැයි කියමු. එහෙත් එම ශ්‍රාවකයන්ගේ දේශනාව අසා එයට සාධුකාරදීමෙන් ඒ සත්‍ය කිසිවකුට අවබෝධ වන්නේ නැත. එම දේශනාවේ ඇති කරුණු අසා ඒවා ලැබෙන්නට ප්‍රාර්ථනා කිරීමෙන් හෝ යාඥා කිරීමෙන් කිසිවකු තුළ ඒ අවබෝධය ඇති නොවන්නේමය.ඒ අවබෝධය ඇති කර ගන්නට නම් තමන් ශ්‍රවණය කළ ධර්මය නුවණෙන් මෙනෙහි කිරීමත්, එම දේශනාව මගින් හෙළි කළ පරිදි දහම් අනුදහම් පිළිවෙතෙහි යෙදීමත් කළ යුතුය. මෙලෙස කටයුතු කරන කෙනා තම ජීවිතය තුළ සෝවාන් අංග උපදවාගත් කෙනෙකු වන්නේය. යම් අයෙකු තමන් තුළ සෝවාන් අංග ඇති කරගත්තේද ඔහු හෝ ඇය සෝවාන් මාර්ගයේ ගමන් කරන්නෙකු බවට පත්වන්නේය. මෙම ධර්මතාව සංයුක්ත නිකායේ දුතිය සාරිපුත්ත සූත්‍රයේ මෙසේ දැක්වෙයි. "එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස ව හුන්හ. එකත්පස්ව හුන් ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේකඃ සාරිපුත්ත, සෝවාන් අඟ සෝවාන් අඟැයි මෙට කියනු ලැබේ. සාරිපුත්ත සෝවාන් අඟ කවරේදැයි. වහන්ස, සපුරිස් සෙවුම සොවාන් අඟෙකි. සදහම් ඇසුම සෝවාන් අඟෙකි. නුවණින් මෙනෙහි කිරීම සෝවාන් අඟෙකි. දහම් අනුදහම් පිළිවෙත සෝවාන් අඟෙකියි.සාරිපුත්ත, මැනවි, මැනවි. සාරිපුත්ත,සපුරිස් සෙවුම සොවාන් අඟෙකි. සදහම් ඇසුම සෝවාන් අඟෙකි. නුවණින් මෙනෙහි කිරීම සෝවාන් අඟෙකි. දහම් අනුදහම් පිළිවෙත සෝවාන් අඟෙකියි." මේ අනුව කෙනෙකු සෝවාන් මාර්ගයට පිවිසුණා යනු ඉහත කී ධර්මතා හතරට නිරාවරණය වීමයි. මෙම ධර්මතා සතර නිතර නිතර කෙනෙකු වඩන විට ඔහු හෝ ඇය අලුත් ජීවිතයකට හුරු වෙයි. එනම් අශ්‍රැතවත් පෘථග්ජන හෙවත් ධර්මය නොදන් සංසාර චාරිකාවට ඇළුණු ජීවිතයේ සිට ධර්මය දැනගත් සංසාරයේ විමුක්තිය සොයන නව ජීවිතයයි. එසේ මාර්ගය වඩන අයකුට ආර්ය ශ්‍රාවකයකු යැයි දහමේ කියැවෙයි. ආර්ය යනු උතුම් යන්නයි. නැත්නම් ලොව්තුරු යන්නයි. බුදුමග යනු උතුම් හෙවත් ලොව්තුරු මගයි. සෝවාන් මග වැඩීම මානසික කරුණකි. එහි ප්‍රතිඵලය වන සෝවාන් ඵලය යනු මානසික පරිවර්තනයකි. මෙම අංග හතර කෙනෙකු තුළ වඩන විට ඔහු හෝ ඇය තුළබුදුහිමි පිළිබඳවත් උන්වහන්සේගේ දහම පිළිබඳවත් ඒ දහම අවබෝධ කරගත් ආර්ය ශ්‍රාවක සංඝ රත්නය පිළිබඳවත් ඒ ශ්‍රාවක උතුමන් පිහිටි සීලය පිළිබඳවත් බලවත් පැහැදීමක් හා කැමැත්තක් හට ගනී. එය ශ්‍රද්ධාව මුල්ව හටගන්නා විට ඔහු හෝ ඇය සද්ධානුසාරී ශ්‍රාවකයා ලෙස හඳුන්වයි. එය ධර්මය මුල්කොට හටගන්නා විට ඒ පුද්ගලයා ධම්මානුසාරී ලෙස හඳුන්වයි. ඒ ආකාරයෙන් සද්ධානුසාරීව හා ධර්මානුසාරීව සෝවාන් මාර්ගය වඩමින් සිටින ඔහුට හෝ ඇයට යම් මොහොතකදී බුදුහිමි හෙළිකළ චතුරාර්ය සත්‍ය ධර්මය පිළිබඳ නොවෙනස්වන දැකීමක් ඇති වෙයි. ඒ අවස්ථාවේදී ඒ පුද්ගලයා කෙනෙකුට මේ සසරේ ලැබිය හැකි වාසනාවන්තම අත්දැකීමට මුහුණ දෙයි. එනම් උතුම් සෝවාන් ඵලයට පත්වීමයි. එවිට ඉහත කී ගුණ සතර කිසිදා නොවෙනස් වන පරිදි ඔහු හෝ ඇය තුළ පිහිටයි. ඒ මහාගුණ සතර සොතාපත්ති සංයුක්තයේ බ්‍රහ්මචරියෝගධ සූත්‍රයේ බුදුහිමි දේශනා කළේ මෙසේය. මහණෙනි සිවුදහමින් යුතු අරීසවුතෙමේ විවසව නොවැටෙන සුලු නියත වූ සම්බෝධිය පිහිට කොට ඇති සෝවාන් වේ. කවර සිවු දහමින් ද යත්, මහණෙනි මෙහී අරීසවු තෙමේ" ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙනු දු අර්හත් හ... යි. දෙව්මිනිසුන්ට ශාස්තෘ හ. බුද්ධහ. භගවත් ම.යි බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වෙයි. "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය ස්වඛ්‍යාත ය.. නුවණැත්තවුන් විසින් තම තමන් කෙරෙහිලා දත යුතු"යි ධර්මය කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුතු වෙයි. "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝතෙමේ සුප්‍රතිපන්නය... ලෝකයාහට අනුන්තරපුණ්‍යක්ෂේත්‍ර ය"යි නො කඩවූ ... සමාධිය පිණිස පවත්නා වූ ආර්යකාන්ත ශීලයෙන් යුක්ත වූයේ වෙයි. මහණෙනි, මේ සිවු දහමින් යුතු වූ අරීසවු තෙමේ විවස ව නොවැටෙනසුලු නියත වූ සම්බොධිය පිහිට කොට ඇති සෝවාන් වෙයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සුගත වූ ශාස්තෘන් වහන්සේ මෙය වදාරා යළි මතු ද මෙය වදාළ සේක.



මේ සෝතාපන් ඵල අවස්ථාව සම්මා දිට්ඨිය ලැබීම වන්නේය. දහම් ඇස පහළ වීම වන්නේය. සම්මා දිට්ඨිය යනු චතුරාර්ය සත්‍ය ධර්මය පරම සත්‍යයක්ය යන අවබෝධයයි. ඒ සමගම තවත් අපූර්ව දෙයක් සිදුවන්නේය. එනම් සක්කාය දිට්ඨිය හෙවත් ජීවිතය තුළ නැත්නම් ජීවත් වීම තුළහේතුඵල වශයෙන් සිදුවන සිද්ධිදාමයක් විනා මම යනුවෙන් පැවැත්විය හැකි කිසිවකු නොමැති බව අවබෝධ වීමයි. එවිට පටිච්ච සමුප්පාදය හෙවත් හේතුඵල දහම පිළිබඳ මනා අවබෝධයක් ඔහු හෝ ඇය තුළ ඇති වෙයි. ඒ වන විටත් සෝවාන් මාර්ගයේදී කලණ මිතුරන්ගෙන් ඇසූ පටිච්ච සමුප්පාදය සත්‍යක්ම බව දැන් ඔහු තමන් විසින්ම ප්‍රත්‍යක්ෂ කරගනී. එම ප්‍රත්‍යක්ෂ ලැබූ අයකු සතුව තවදුරටත් සැකයක් නැත. නිසැක වශයෙන්ම ඒ සොබාදහමේ නීතිය නැත්නම් සිද්ධාන්තය සාක්ෂාත් කළ අයකු තවදුරටත් විමුක්තිය සොයා කිසිදු මිථ්‍යා සීලයක් හෝ ව්‍රතයක් සමාදන් වන්නේ නැත. මක්නිසාද යත් සත්‍ය ඥාණය හෙවත් සිව්සස් දහමේ සත්‍ය පිළිබඳ නුවණ ඇති වූ අයෙකු ඒ වන විටත් සංසාරයට බැඳ තබන මානසික බැමිතුනක් ඒ වන විට කඩා දමා ඇති බැවිනි. ඒවා පාලියෙන් කියන්නේ නම් සක්කාය දිට්ඨි ( මම කියා කෙනෙක් ඇත යන හැඟීම) විචිකිච්ඡා ( විමුක්ති මාර්ගය කෙරේ සැකය) හා සීලබ්බත පරාමාස (විමුක්තිය පිණිස විවිධ මිථ්‍යා මාර්ගවල ගමන් ගැනීම) තුනයි. මේ සංසාර බැඳීම් කඩා බිඳ දැමූ උතුමෙකු සෝවාන් ඵලපත් උතුමෙකු වන්නේය. මජ්ජිම නිකාය 2 මහා මාලුඞක්‍ය සූත්‍රයේ බුදුහිමි ඒ බව මෙසේ දීර්ඝ වශයෙන් දේශනා කොට ඇති සේක. "තවද ආනන්දයෙනි ශ්‍රැතවත් වූ ආර්යශ්‍රාවක තෙමේ (බුද්ධාදි) ආර්යයන් දක්නේ ආර්යධර්මයට නිපුණ වූයේ ආර්යධර්මයෙහි මොනොවට හික්මුණේ සත්පුරුෂයන් දක්නේ සත්පුරුෂධර්මයට නිපුණ වූයේ සත්පුරුෂධර්මයෙහි මොනොවට හික්මුණේ සත්කායදෘෂ්ටියෙන් නොමඬනාලද සත්කායදෘෂ්ටි අනුගත නො වූ සිතින් යුක්තවැ වෙසෙයි. උපන් සත්කායදෘෂ්ටියගේද නිස්සණය ඇති සැටියෙන් දනියි. ඕහට ඒ සත්කායදෘෂ්ටිය අනුශය සහිතවැ ප්‍රහීණ වන්නේයැ. චිකිත්සායෙන් නොමඬනාලද චිකිත්සාව අනුව නොගය සිතින් යුක්තවැ වෙසෙයි. උපන් විචිකිත්සාවගෙද නිස්සරණය ඇති සැටියෙන් දකි. ඕහට ඒ විචිකිත්සාව අනුශය සහිතවැ ප්‍රහීණ වන්නේයැ. ශීලව්‍රතපරාමාර්ශවෙන් නො මඬද ශීලව්‍රතපරාමශානුගත නොවූ සිතින් යුක්තවැ වෙසෙයි. උපන් ශීලව්‍රතපරාර්ශයාගේද නිස්සරණය ඇති සැටියෙන් දනි. ඔහට ඒ ශීලව්‍රතපරාමර්ශය අනුශය සහිත වැ ප්‍රහීණ වන්නේ යැ." එනයින් සෝවාන්ඵලපත් උතුමෙකු දහමෙහි දැක්වෙන්නේ දර්ශන සම්පත්තිය ලැබූ අයෙකු වශයෙනි. තමා පැමිණි සසරත් තමා තව යා යුතු දුරත් ඔහුට දැන් දර්ශනය වෙයි. සතර අපායෙන් මිදුණු එවන් සෝවාන් උතුමෙකු සක්විති රජකමටත් වඩා උතුම් ඵලයක් ලැබුවෙකි. අද අර්ථයෙන් කිවහොත් යම් රටක, කලාපයක, මහාද්වීපයක මතු නොව මුළු පෘථිවියේම නායකත්වය, ආධිපත්‍ය ලබන්නෙකු ලබන යම් බලයක්, ධනයක් සැපතක් වේද ඒ සියල්ල සෝවාන් ඵලය හා සසඳන කල මහාමේරුව ළඟ කුඩා ගල්කැටයක් බඳුය. මේ සෝවාන්මාර්ගඵලලාභී උතුමෝ අදටත් මේ රටේත්, ලෝකයේත් වැඩවාසය කරති. එබැවින් සිරිලකට දහම් පණිවුඩය ලැබුණු පොසොන් පෝදා සියලු දෙනාම අධිෂ්ඨාන කරගත යුත්තේ සෝවාන් මාර්ගඵලය සාක්ෂාත් කරගැනීම මේ ජීවිතයේ කෙසේ හෝ සිදු කරගන්නේය යන්නයි. මක්නිසාදයත් කොරෝනා ඇතුළු මහාදුක් සහිත මේ සංසාරයෙන් මිදීමේ එකම මාර්ගය ධර්ම මාර්ගයට පිවිසීමේ දොරටුව වූ සෝවාන් මාර්ගයයි. එහිදී ඇසිය යුතු ගැඹුරු දහම් කොටස් සරලව ඉදිරියේදී සාකච්ඡා කරන බලාපොරොත්තුවෙන් මේ දහම් සංදේශය මෙතෙකින් අවසන් වනු ඇත.

**සියලු සත්ත්වයෝ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කර ගනිත්වා !!!**

# Fire of Lust

**Tharindu Dananjaya Weerasinghe**
Senior Lecturer, Department of Human Resource Management, University of Kelaniya, Sri Lanka

**Lust is likened to a sharp knife, a sharp weapon, or a sharp thorn.**



The fire of lust will not be extinguished from beings until Nirvana is realized. He who does not see the origins of lust is never ready to get rid of lust. Knowing the origins of lust is the cause of happiness for all of us in this world and the hereafter. The Supreme Buddha pointed out in ten parables in the ***Alagaddupama Sutta*** the consequences of clinging to lust.

Working committee of ACBC

**President** - Mr Chandra Nimal Wakishta
**Imm. Past president** - Mr Jagath Sumathipala
**Deputy President** - Mr Roshan Sampath Madduma

**Vice presidents**

- Mr Vasantha de Silva
- Mr Upul Rupasinghe
- Dr Rani Fernando
- Mr Lakshman Kottage
- Dr keerthi Thilakarathna
- Mrs Nilika Senanayaka
- Prof Nimal de Silva
- Prof Susiripala Malimbada
- L.M.K Thilakarathne
- Mr Lalinda Ranaweera
- Lalindra ranaweera

**Joint secretaries**

- Mr Dilum Wahalathanthri
- Mr Ishan Edirisuriya

**Tresurer**

- General Daya Ratnayaka

**Ass. secretaries**

- Mr Ravi pieris
- Mr E wickramasinghe

බෞද්ධාලෝකය

Editorial Board

- Prof. Prneeth Abayasundara
- Dr. Rani Fernando
- Mr. Ishan Edirisuriya
- Dr. Ashok Karunarathne
- Mr. Nalaka Jayasena
- Shyam Nuwan Ganewattha

Art work design

- Kavindu Randimal De Alwis

**Lust is like a bone.**
No matter how long a piece of dry bone without flesh and blood is kept in the mouth, the dog's stomach will never be full. Similarly, a proponent of meaningless lust will never be satisfied with what he/she thinks is enough. The one who loves lust will never understand the meaningless little pleasure in it. Therefore, lust is like a piece of dry bone without flesh and blood.

**Lust is like a piece of meat.**
Other hawks chase after a hawk that takes a piece of meat and flies into the sky. Continuing to indulge in lust unknowingly inherits the same fate as the hawk that flew into the sky with a piece of meat. What you have to suffer is the same persecution that the hawk has to face. We have seen an infinite number of conflicts, quarrels, pressures, etc. in the society that people have to face after being greedy and engrossed in lust.

**Lust is like a burning grass.**
The burning grass begins to burn rapidly when the wind blows. What happens if we do not let go of the burning grass? If the burning grass is not left untouched, it will burn the hands of the person holding it. Thus, the Supreme Buddha preached that just as we are burned by the burning grass that is not given up, so too we can be mentally corrupted and burned by excessive attachment to lust.

**Lust is like a coal pit.**
It's like a terrible coal pit with no flames, no smoke. What is so special about a coal pit? There is an invisible danger in such a coal pit, even if the flames are not visible outside. So is lust. How much a person who keeps the fire of lust hidden from the outside world suffer from lust and burn inside? Sticking to excessive lust and not showing it off is like the flames hidden under the ashes. In any case, it can come up and create new flames and start a fire. The hidden lust is extremely frightening.

**Lust is like something begged from others.**
The Supreme Buddha pointed out that lust is like something that is temporarily demanded from others. What is demanded from others and used, should be given back as soon as it is requested. They should be returned to the owners, no matter how proudly they are used, without thinking that they belong to others. Things that belong to us today may have been inherited by someone else yesterday. It could fall into the hands of someone else tomorrow. Nothing we have today will be ours forever. Such is the state of excessive attachment and bonding. It is impossible to say at what time the inspiration from such attachments will be lost and we will be in pain. So, lust is like something that begs and never belongs to us.

The Supreme Buddha likened lust, to a person who climbs a tree and eats fruits. In this way, the Buddha explained how the one who is greedy for pleasure falls down with lust and perishes. It is similar to the one who climbs a fruit-bearing tree and eats its fruit without limits. Seeing this, those who could not climb the tree might cut down the tree out of jealousy. Similarly, the person who is blinded by lust perishes due to the limitless lust.



**Lust is like a piece of meat stuck between a sword and a trunk.**
The piece of meat between the sword and the trunk is easily cut and crushed. Similarly, all those who are caught in the fire of lust will be crushed and destroyed easily. What is left after being subjected to excessive bondage? All that is left are broken lives without humanity, crushed lives without capability, and the broken pieces of the brain without discipline.

**Lust is likened to a sharp knife, a sharp weapon, or a sharp thorn.**
Lust is like a sharp weapon used to destroy others. When we look at the world with contemplation, we see how they divide into factions and take up arms out of passion and attachment. Throughout history, 'world powers' have entered into terrible wars with the desire to seize limited land and resources. The Sakya Koliyadynasty embarked on a war to divide the water of the Rohini River even during the lifetime of the Buddha. That is the nature of fire of lust. Finally, the Supreme Buddha likened lust to aserpent's head, pointing out its futility and horror. The venom is in the serpent's head. Serpent plans to attack the other and takes aim at it with its head. Similarly, we have heard in the society that those who are deceived by lust sometimes kill their parents out of greed for material things like estates and houses. We have also seen instances where those who have been deceived by illicit love affairs have madly planned to destroy even their own children. That is the nature of excessive lust.

**Therefore, one must know with the right wisdom that whatever is the source of lust in this world, such as image, sound, smell, etc., is not all mine, not me, and not my soul.**

(The Alagaddūpama Sutta contained in the Majjhima Nikāya was referred to compile this article)

# වස්තු තෘෂ්ණාව සහිත ව දන් දීම

## සැප සම්පත් වින්දනයට හේතු නොවේ.

**රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පැපිලියවල නාරද හිමි**

මෙවර පොසොන් පුණ්‍ය මහෝත්සවය ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව කෙරෙහිම යොමු වීම සඳහා පරිසරය සකස් වී ඇත්තේයි බුදුරජාණන් වහන්සේ සිය ශ්‍රාවකයන් අමතා දේශනා කරන ලද්දේ ද 'නහි මය්හං මාලාගන්ධාදීහි පූජං කරොන්තො මම පූජං කරොන්ති නාමං ධම්මානුධම්මං පටිපජ්ජන්තා එව පන මං පූජෙන්ති නාම' හෙවත් 'මල්ගඳවිලවුන්ගෙන් මා හට කරන පූජාව සැබැවින්ම මා වෙත කරන පූජාව නොවෙයි; ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් කෙරෙන පූජාව ම මවෙත කෙරෙන පූජාව වෙයි;' යනුවෙනි සමථවිපස්සනා ධර්මයන්හි සිත් අලවා වාසය කිරීම (ධම්මරාමො) ධර්මයෙහි ම ඇලීම (ධම්මරති) නැවත නැවතත් ධර්මයම සිතීම (ධම්මං අනුවිචින්තයං) මෙනෙහි කිරීමං ආවර්ජනය කිරීම නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයෙහි චිරස්ථිතිය පිණිස ම පවතින අතර පුද්ගල නො පිරිහීම පිණිස ද හේතුවන්නකි එසේ යෙදීමෙන් විඳින රසය සියලු රසයන් අතරින් අග්‍ර වන අතර සියලු ඇලීම් අතරින් ද අග්‍ර වෙයි ඒ අන් රසයන් හා ඇලීම් මගින් තෘෂ්ණාව ජනනය වන හෙයිනි තෘෂ්ණාව සසරට හේතුවන අතර එමගින් බොහෝ දුක් ද ඇති වෙයි

තෘෂ්ණාව නිසා සසර බොහෝ සැප සම්පත් විඳීමට අවකාශ ලද ද එය වැළකී ගිය අපුත්තක සිටාණන්ගේ පවත මගින් තණ්හාව නිසා අනුන් නසන්නාක් මෙන් තමා නසා ගැනීමට මනා නිදර්ශනයකි

සැවැත් නුවර විසූ අපුත්තක සිටාණන් මහත් වූ වස්තු සම්භාර ඇති ව විසූ ධනවත් සිටුවරයෙකි එහෙත් අපුත්තක සිටාණන්ට ට දරු සම්පත් අහිමි වූයේ පෙර ආත්භවයක ඔහුගේ සහෝදරයාගේ පුතණුවන් ඝාතනය



කළ හෙයිනි එකල එම පුතණුවන් සිය පියාගේ හදිසි අභාවය හේතුවෙන් මෙම සිටුවරයා සමීපයෙහි විසීයි කුඩා දරුවා මොහුගේ ඇඟිල්ල අල්වාගෙන ඇවිදින කාලයෙහි 'මේ මාගේ පියාගේ රථයයි; මේ ඔහුගේ ගොනා යි;' ආදී වශයෙන් සිය පියාගේ ධනය පෙන්වමින් පවසන්නට වියි

මේ හේතුවෙන් මේ සිටුතුමා කුඩා කල පටන්ම සහෝදරයාගේ පුතා මෙබස් පවසනනේ නම් ඔහු වැඩුණු කාලයෙහි මේ වස්තු සම්පත් මොහු අතරේද බෙදීයන්නේ ය'

යනුවෙන් සිතී එසේ සිතා ධනය නො බෙදීයාමට නම් ඔහු මරා දැමිය යුතු යැයි කුඩා දරුවා කැලයට ගෙන ගොස් එක් ගසක් මුල දී බෙල්ල අල්ලා මුල්කඳක් මෙන් පලා ගෙල සොලවා මරණයට පත් කොට එහි ම දමා ගියේයි මේ හේතුවෙන් බොහෝ වර්ෂ දහස් ගණනක් නිරයේ පැසී සත්වැනි ආත්මභාවයේදී දරුවන් නොමැතිව සිටුවරයෙක් ව විසීයි

සත් වෙනි අත්බවයේ දී සැවැත්නුවර අපුත්තක සිටාණන් ව ප්‍රසිද්ධ ව දරුවන් නොමැති හෙයින් ඔහුගේ ඇවෑමෙන් ඔහු සන්තක ධනයට හිමිකරුවෙක් නොමැති වියි එහෙයින් අපුත්තක සිටාණන්ගේ

අභාවයෙන් පසුව ඔහු සන්තක ධනය රාජසන්තක වූ අතර කොසොල් රජු ඔහුගේ ධනය සත් දවසක් පුරා රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙන්වා ගත්තේයි එහි රන් මිල ම අසූ ලක්ෂයක් වූ අතර රන්□ රිදී□ තඹලෝ

නිවසට ද වැඩම කළහි ගෘහපති තෙමේ ද තද මසුරු සිත් ඇත්තේ නමුත් පසේබුදුන් දැක 'මුන්ට දන් දෙව' යි පවසා කිසියම් කටයුත්තකට බැහැර ගියේයි බිරිඳ ද සිය ස්වාමියාගේ බස් අසා සතුටුව පසේ

න් එම සම්පත් විඳීමට නොහැකි වුයේ ම යි අපමණ සම්පත් තිබියදීත් දුගීදුප්පත් තැනැත්තෙකු මෙන් විසී යි එහෙයින් බුදුහු□

හන්ති භොගා දුම්මෙධං - නො ච පාර

**හන්ති භොගා දුම්මෙධං - නො ච පාර ගවෙසිනො භොග**

**තණ්හාය දුම්මෙධො - හන්ති අඤ්ඤෙ ච අත්තානං**

**(ධම්මපද තණ්හාවග්ග 10 ගාථා)**

පරිභෝග භාණ්ඩ ආදී වර්ග හා රිදී භාණ්ඩවල මිල කිව නොහැකි තරම් වියි එතෙකුදු වුවත් අපුත්තක සිටාණන් කිසිදු දිනක එම වස්තු සම්පත් පරිභෝග නොකළේ යි රන් රිදී භාජනවල ඉතා අග්‍ර වූ භෝජන අනුභව කිරීමට හැකියාව තිබියදී කබල් භාජනයකි කාඩි හොදියි දෙවැනි කොටැති නිවුඩු සහල් සමග ම අනුභව කළේ යි කසීසළු හැඳීමට හැකියාව තිබියදී කැබැලි තුනක් දෙතැනකින් මසාහණ නූලෙන් කළ වස්ත්‍ර ම ඇන්දේ යි යෑම්ඊම් ආදිය මහලු ගොනුන් යෙදූ පරණ කරත්තයකින් ම සිදු කළේ යි

මෙසේ අපමණ සම්පත් තිබියදීත් එම වස්තු සම්භාරයන් පරිභෝග කිරීමට සිත් නොයෙදීම පිළිබඳව පූර්ව කර්මය කෙසේදයත්□ පෙර අපුත්තක සිටුවරයා තගරසිඛී පසේ බුදුරදුන්ගේ සමයෙහි ගෘහපතියෙක් ව සිය බිරිඳ හා වාසය කළේ යි බිරිඳ මහත් සැදැහැති තැනැත්තියක් වූ අතර පසේ බුදුරදුන්ට දන් පූජා කිරීමෙහි සිත් අලවා විසී යි එහෙත් සිය ස්වාමියාගේ තද මසුරු සිත් පිළිබඳ දැන සිටි ඈ ඊට හිමියාගෙන් අවසරයක් නොලබන බව දැන ඊට උත්සුක වූවායි දිනක් පසේ බුදුරජාණන් වහන්සේ පිඬු පිණිස හැසුරුණේ මෙම ගෘහපති



බුදුරදුන්ගේ පාත්‍රය පුරා මධුර ආහාර පූජා කළායි දන් පූජා කිරීම සඳහා විධානය කළ ගෘහපති තෙමේ සිය කටයුත්ත නිමවා නැවත නිවස බලා පැමිණ ශ්‍රමණයන් කුමක් ලද්දේ දැයි පසේ බුදුරදුන්ගේ පත්‍රය ගෙන පූජා කළ දානය පරීක්ෂා කළේ යි එසේ පරීක්ෂා කිරීමේ දී ඉතා මධුරාහාර පූජා කර ඇති බව දැක මෙතරම් මධුර ආහාර දැසි දස්සෙකුට දුන්නේ නම් අපගේ කර්මාන්තයක් කරවා ගත හැකි ව තිබිණි; මොවුන් දන්

වළඳා නිදා ගැන්ම හැර අන් කිසිවක් නොකරෙයි යනාදී වශයෙන් සිතා මධුරාහාර පූජා කළේ කුමට දැයි සිත්තැවුලට පත් වියි

මෙලෙස දන් දීමට විධාන කළ නමුත් දුන් දානය පිළිබඳ වස්තු තණ්හාවෙන් සිත් සතුටු නොවූ හෙයින් දන් දෙන්ට විධාන කළ පිනෙන් මේ සැවැත්නුවර ම සිටු පදවි ලද මුත් සිත් පහදවා ගත නොහැකි වූ හෙයි-

ගවෙසිනො භොග තණ්හාය දුම්මෙධො - හන්ති අඤ්ඤෙ ච අත්තාන

අනුවණයා ආහාර රෙදිපිළි ආබරණ ආදී උපභෝග සම්පත් හා ගේදොර ඉඩකඩම් ආදී පරිභෝග සම්පත් නසන්නේ යි පරතෙර සොයන පුද්ගලයා උපභෝග පරිභෝග සම්පත් නොනසන්නේ යි එහෙත් අනුවණයා උපභෝග පරිභෝග වස්තු කෙරෙහි ඇති ආශාව නිසා අනුන් නසන්නාක් මෙන් තමාවම නසා ගන්නේ ය යනුවෙන් වදාළහි

මේ හේතුවෙන් සත්පුරුෂ හුදී ජනයා වස්තු තෘෂ්ණාවෙන් තොරව ම දාන කර්මාන්ත සිදු කොට ඒ පිළිබඳව සිත පහ පහදවා ගත යුතුයි නැතහොත් දාන විපාකය ලැබුණ ද එය වින්දනය කිරීමට සිත් පහළ නොවන්නේ ම යි

**සුඛී හොතු නිද්දුක්ඛො හොතු නිබ්බාණ පච්චයො හොතු**

# රජගල

# ආරාමික භූමි දර්ශනය

## කථිකාචාර්ය, ආචාර්ය එච් එච් ඒ කරුණාරත්න

ලංකාවේ බුදුදහම ප්‍රතිෂ්ඨාපනය වීමේ සිට එහි ව්‍යාප්තිය දක්වා මිහින්තලය චිත්තල පබ්බතය ආගමික කේන්ද්‍රස්ථානයක් විය. සිතුල්පව්ව හා දිඹුලාගල වැනි ස්ථාන පසුකාලීනව ආගමික මධ්‍යස්ථාන වී ඇත්තේ ද පර්වත කේන්ද්‍රකර ගනිමින් ව්‍යාප්ත වූ ලෙන් ආරාම සංකල්පයේ වර්ධිත පියවරක් ලෙසිනී ඉතා පුරාණ කාලයේ පටන් කඳු ශිඛර හා පර්වත මුදුන් කෙරෙහි පැවැති පූජනීයත්වයත් භික්ෂූන් වහන්සේලාට භාවනානුයෝගීව වැඩ සිටීමට යෝග්‍ය පරිසරයක් මේ සඳහා හේතු වන්නට ඇත (බස්නායක□1983:51) එහෙත් පසුකාලීනව තැනි භූමියෙන් බැහැරව ප්‍රාදේශීය ප්‍රදේශවල පබ්බත විහාර සංකල්පය වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මුල් කාලයේ භික්ෂු භාවිතයේ පැවති ලෙන් පබ්බත විහාරයන්හි "විහාර" ලෙස භාවිත වූ බව විද්වත්හු පෙන්වා දෙති (ගුණවර්ධන□2009:65) ආරාම වර්ගීකරණය අනුව ඒවායේ ඉදිකිරීම් ව්‍යූහය හා සැලසුම් පිළිබඳ එක් ප්‍රදේශයක එක් කාල සීමාවකට සීමා වෙමින් සිදු කළ හෙයින් දීපව්‍යාප්තව පවතින ආරාම පිළිබඳ එම රාමුව තුළ සිටිමින් අධ්‍යයනය කිරීම යෝග්‍ය නොවේ මන්ද ප්‍රාදේශිය භූමි දර්ශනය අනුව බොහෝ ආගමික ඉදිකිරීම්වල උපවිෂයයීය අංග අදාළ පරිසරානුබද්ධව වෙනස් වී ඇති හෙයිනී බෞද්ධ ආරාමයක් තුළ පොකුණු ඉදිකළ යුතු ආකාරය සඳහන් න්‍යායයෙන් බැහැරව රජගල ආරාමයේ පොකුණු ස්වභාවික පාෂාණ පර්වත පදනම්කර නිර්මාණය කර ඇතී මෙයට හේතු පාදක වී ඇත්තේ ආරාම පරිශ්‍රය මුහුදු මට්ටමින් අඩි 1038ක් උසින් පිහිටීම නිසා



භූගත ජලය පිළිබද විශ්වාසය තැබිය නොහැකි හෙයින්□ වර්ෂා ජලය හා ජල උල්පත් ජලය මනා කළමනාකරණයකින් රැස්කර ගනීමට ක්‍රියා කිරීමයී

ලාංකේය ඉතිහාසයේ ප්‍රථම විහාරාරාම සම්ප්‍රදාය වූයේ ස්වභාවික ගල්ලෙන් භික්ෂූන් සඳහා පිළියෙල කිරීමයී මිහින්තලය කේන්ද්‍ර කරගනිමින් ආරම්භ වූ මෙය පසුකාලීනව වෙස්සගිරිය□ සිතුල්පව්ව□ සීගිරිය□ දඹුල්ල□ රිටිගල□ අරන්කැලය□ රජගල□ කුඩුම්බිගල□ සමනබැද්ද□ ප්‍රාදේශීය වශයෙන් පුළුල් ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇතී ආධ්‍යාත්මික සුවතාව වර්ධනය කර ගැනීමේ අරමුණින් ස්වභාවික පාෂාණ උද්ගත සහිත හුදෙකලා ප්‍රදේශ ලෙන් ආරාම ලෙස තෝරා ගැනීමට බලපාන ලදී මෙම ලෙන් විහාරවල කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ ඒවා සාමාන්‍ය පරිසරයෙන් වෙන්ව උස් කඳු මුදුන්වල විසිරි ඇති ගල්ලෙන් පාදක කොට නිර්මාණය වීමත්□ කදු ශිඛරවල තැනි නිම්න කලාපය පොදු ගොඩනැගිලි සඳහා යොදා ගැනීමත් යී ශ්‍රී ලංකාවේ පැරණි ඉතිහාසය දෙස බැලීමේ දී□ බෞද්ධ විහාරාරාමයන්හි ආරම්භය ක්‍රිපූ තුන් වැනි සියවස තුළ සිදු වන්නට ඇති බව වංශකතාකරු පෙන්වාදෙයි (ගුණවර්ධන□ 2010:30) අනුරාධපුර යුගය ක්‍රිපූ තුන්වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂයෙන් දහවන ශත වර්ෂය දක්වා විහිදී යයී එම අවධියට අයත් භූමි ප්‍රදේශයෙන් අනාවරණය කොට ගෙන ඇති ඉදිකිරීම් සාධකවලින් වැඩි කොටසක් බෞද්ධ විහාරාරාම ක්ෂේත්‍රයට අයත් වේ වංශකතාගත මූලාශ්‍රය පදනම්කර ගනිමින් මෑතක් වනතුරු විහාරාරාම පිළිබඳව අර්ථකථන ඉදිරිපත් කළ ද□ ද්‍රව්‍යාත්මක සාධක මත පදනම් ව ආරාමික ඉදිකිරීම්වල ව්‍යූහය නිරීක්ෂණය කර අර්ථ විග්‍රහවලට පෙළඹී ඇත්තේ 19 වන සියවසයෙන් පසුවයී දැනට අනාවරණය කරගෙන ඇති වාස්තුවිද්‍යා නිර්මාණ හා ආකෘතිය පදනම් කරගෙන එම විහාරාරාම ඓන්ද්‍රිය හෙවත් ලෙන් විහාරාරාම□ නාගරික විහාරාරාම හෙවත් මහාවිහාර වර්ගයට අයත් ආරාම□ පබ්බත විහාර හෙවත් ප්‍රාදේශීය විහාර□ පධානඝර හෙවත් ද්විත්ව වේදිකා ගොඩනැගිලි විහාරාරාම□ ආරෝග්‍යශාලා හෙවත් ගිලානඝර විහාරාරාම හා පංචායතන හෙවත් ගොඩනැගිලි පහක් සහිත විහාරාරාම වශයෙන් පුළුල් වර්ගීකරණයකට ලක්කර ඇත (එම්31)

පළමු විහාර වර්ගය වන්නේ ඓන්ද්‍රිය හෙවත් ලෙන් විහාරාරාමයී අනුරාධපුර මුල් අවධියට අයත් මෙම විහාරාරාම වර්ගය කඳු ශිඛර පාදක කරගනිමින් ගොඩනැගී ඇතී ජ්‍යාමිතික සැලැස්මක් රහිත ආකෘතියකට අනුව මෙම ආරාමික නටඹුන් විහිදී ඇති බව පැහැදිලියී එයට පාදක වී ඇත්තේ එම ලෙන් ආරාමය ව්‍යාප්ත භූමියේ ස්වභාවික භූමි දර්ශනය මත ඇති පාෂාණ උද්ගතයන්හි පිහිටීමයී රජගල ආරාම භූමියේ අධ්‍යයනයට බදුන්කරන ලෙන් ආරාම සංකීර්ණය හැරුණු විට පොදු ගොඩනැගිලි කලාපයත් දෙවන ආගමික ගොඩනැගිලි කලාපයත් අතර වැවට ඉස්මත්තේ ඇති පාෂාණ උද්ගතයන් කේන්ද්‍රකර ගනිමින් ද ලෙන් හදුනාගත හැකි වීම මේ බව පැහැදිලි වන කරුණකී මෙයට සමානත්වයක් සාම්‍යක් දක්වන වෙනත් ආරාම පරිශ්‍රයන් ලෙස අරන්කැළය□ රිටිගල□ මානෑව කන්ද□ මිහින්තලය කළුදිය පොකුණ ආදී ලෙන් ආරාම වැදගත් වෙයී දෙවන වර්ගය වන්නේ මහාවිහාරාරාම වර්ගයට අයත් විහාරාරාමයී පූර්ව සැලැස්මක් ඇතිව ඉදිකරන ලද ප්‍රථම ආරාම වර්ගය ලෙස සැලකිය හැකියී මෙහිදී සමස්ත විහාරාරාම සංකීර්ණය ඉදිකරනු ලබන්නේ ස්තූපය හෝ වටදාගෙය කේන්ද්‍රකර ගනිමිනී අනුරාධපුරයේ පිහිටි රුවන්මැලිසෑය□

අභයගිරිය□ ජේතවනය□ ථූපාරාමය□ ලංකාරාමය ආදී වටදාගෙවල් සම්ප්‍රදායට අයිති නිර්මාණ පදනම් කොට ඉදි වූ විහාරාරාම සංකීර්ණ මගින් මහා විහාරාරාම සම්ප්‍රදාය හඳුනාගත හැකියි මාගම අගනුවර කරගනිමින් වර්ධනය වූ තිස්සමහාරාම යටාල වෙහෙර□ සඳගිරි දාගැබ කුණික් වෙහෙර මගින් ද මහා විහාර වර්ගයට අයත් සම්ප්‍රදායන් නියෝජනය කරයි :ඨමබ්අර්ාය්-බ්ල2010*ග මෙම විහාරාරාම තදාශ්‍රිත ප්‍රදේශයේ□ බෝධිය□ ප්‍රතිමාගෘහය□ පොහොයගෙය හා සංඝයා වහන්සේලාගේ ආවාස ගොඩනැගිලි පිහිටුවා ඇති

පබ්බත විහාර සම්ප්‍රදාය අර්ධනාගරික භූගෞලීය කලාප ඔස්සේ වර්ධනය වූ සම්ප්‍රදායක් ලෙස හඳුනාගත හැකියි මෙය සංකීර්ණ විහාර සැලැස්මකින් යුක්ත වේ මෙහි ප්‍රධාන සැලැස්ම තුළ පිහිටි ස්ථූපය□ බෝධිය□ ප්‍රතිමා ගෘහය හා පොහොය ගෙය පූජනීය තත්ත්වයෙහිලා සැලකිය හැකියි ඊට පරිබාහිර ප්‍රධාන නොවන සැලැස්ම තුළ සංඝයා වහන්සේලා අයත්□ ආවාස□ භොජන ශාලා□ ජන්ථාඝර□ කැසිකිළි□ වැසිකිළි ආදී අංගවලින් සමන්විත වියි ශ්‍රී ලංකාවේ විවිධ පළාත්වලින් මෙවැනි සැලසුම් සියයකට ආසන්න ප්‍රමාණයක් ඇති බව අනාවරණය කරගත හැකියි ඒ අතුරින් ප්‍රසිද්ධ පබ්බත විහාර සම්ප්‍රදාය නියෝජනය කරන ආරාමික සංකීර්ණ ලෙස□ තොලුවිල□ විජයාරාමය□ පුලියන්කුලම□ පංකුලිය□ පාචීන තිස්සපබ්බත□ සීගිරිය□ දඹුල්ල මැණික් දෙණ□ කළුදිය පොකුණ□ වඩාත් ප්‍රසිද්ධ ස්ථාන ලෙස සැලකිය හැකිය (ගුණවර්ධන□ 2010:33)

පංචායතන විහාරාරාම අනුරාධපුර අවසාන කාල පරිච්ඡේදයට අයත් සම්ප්‍රදායක් ලෙස සැලකිය හැකියි එය විශාල විහාරාරාමයක් තුළ ඉදි වූ තවත් විහාරාරාම විශේෂයකි පංචායතන විහාරයන් සම්භවයක් වන්නේ මහාවිහාර සම්ප්‍රදාය නැතහොත් නාගරික විහාරාරාම ඇසුරෙනි මෙම ආරාම වර්ගය ඉහත විහාරාරාම වර්ග තුනට වඩා සංකීර්ණත්වයක් උසුළන හෙයින් අධ්‍යයන ප්‍රදේශයේ ඉදිකිරීම් හා භූ දර්ශනය සමග දුරස්ථ සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි

රජගල ආරාම පුරාවිද්‍යා පරිශ්‍රයේ ඉදිකිරීම් ලක්ෂණ අනුව කුමන විහාර වර්ගයට අයත්දැයි යන්න පිරික්සීමේදී යථෝක්ත විහාර වර්ග කිරීම සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක නියැළෙන්නට විදු වියි ඉහත සදහන් විහාර වර්ග අතුරින් අධ්‍යයන ප්‍රදේශය තුළින් ලෙන් විහාරාරාම හා පබ්බත විහාර ලක්ෂණවලට සමාන බවක් සාම්‍යබවක් උසුළන ලක්ෂණ හදුනාගත හැකි වුව ද වඩාත් සමීප ආරාමික ඉදිකිරීම් හා විහාර සැලසුම අනුව කුමන විහාර වර්ගයක් නියෝජනය කරන්නේ දැයි තහවුරුකර ගැනීම සිදු වියි කෙසේ වුවත් භූගෝලීය පිහිටීම් හා ප්‍රාදේශිය බලපෑම් පදනම් කරගනිමින් ඉදි වූ විහාර අගනගරයේ විහාර සැලසුම්කරණයට වඩා ස්වාධීනභාවයක් ගත් අයුරු හඳුනාගත හැකි වියි යථෝක්ත විහාරාරාම වර්ගීකරණයේ උපවිෂයීය කාණ්ඩ පිළිබදව සැලකිලිමත් වීමේ දී ආරාමික පරිශ්‍රයේ වඩාත් සමීප බවක් දක්වනුයේ ලෙන් විහාර හා පබ්බත විහාර යන ප්‍රධාන විහාර ද්විත්වයටයි රජගල පුරාවිද්‍යා පරිශ්‍රය තුළින් ඉහළ නිර්මාණ ලක්ෂණ හා වාස්තුවිද්‍යා ලක්ෂණ සහිත ලෙන් සියයකට අධික ප්‍රමාණයක් හඳුනාගත හැකි වුව ද සමස්ත ආරාම පරිශ්‍රයේ පොදු ඉදිකිරීම් කලාපය හා ආගමික ඉදිකිරීම් කලාප පිළිබඳ ව සැලකිල-



ʽමත් විමේ දී සංකීර්ණ බවක් උසුළයි එහෙයින් ලෙන් විහාරයකට වඩා දියුණු ආරාමික ඉදිකිරීම් ලක්ෂණ මේ තුළින් නිරූපිත බව පැහැදිලියි එහෙත් ආරාමික පරිශ්‍රයේ ඓතිහාසික භූමි දර්ශනය පිළිබඳ සිදුකළ අධ්‍යයනයේ දී ආරාමික භූමි දර්ශනයේ දෙවන අවධිය ලෙන් ආරාමයක් ලෙස පැවැති අවධිය ලෙස අධ්‍යයනයට බඳුන් කරන ලදී පර්යේෂණයේ දී කුමන වර්ගයේ විහාර වර්ගයකට අයත් දැයි තහවුරුකර ගැනීමේ දී ආරාමික භූමි දර්ශනයේ අවසාන ජීවි අවධිය දක්වා සිදු වූ ඉදිකිරීම්□ සැලසුම් හා ව්‍යුහය පිළිබඳ පමණක් පිළිබද සැලකිලිමත් වෙමින් අර්ථකථනවලට එළඹිණි එනම් මෙහි අවසාන ක්‍රියාකාරී අවධිය ලෙන් විහාර විහාරයකට වඩා නාගරික වාස්තුවිද්‍යා ලක්ෂණ සහිත ආරාමයක් බව තහවුරු කරගත හැකියි

රජගල ආරාම පරිශ්‍රය පබ්බත විහාර වර්ගයට අයත් බව තහවුරු කිරීමේ දී පබ්බත විහාරයක අන්තර්ගත උපවිෂයයීය විහාර අංගයන් හා සැලසුම්වලට වඩාත් සමීප බවක් ඇති බව හඳුනාගත හැකියි අගනගරය කේන්ද්‍රකර ගනිමින් බිහි වූ පබ්බත විහාරවලින් බැහැරව ප්‍රාදේශීය උපනගර හෝ ග්‍රාමීය ප්‍රදේශවලද මෙවැනි විහාර ලක්ෂණ හඳුනාගත හැකි බව පෙන්වා දෙයි (ජයවීර□2001:44) බොහෝ විට ප්‍රාදේශීය වශයෙන් හඳුනාගත හැකි පබ්බත විහාරවල අගනගරයේ ආකෘතිවලින් බැහැර යම් දුරස්ථ බවක් පෙන්නුම් කරන බව ප්‍රාදේශිය භූගෝලීය පරිසරය පිළිබද සැලකිලිමත් විමේ දී පැහැදිලියි මෙවැනි ප්‍රාදේශීය පබ්බත විහාර ලෙස□ සීගිරිය අසල කළුදිය පොකුණ□ රුහුණ මඟුල් මහාවිහාරය (ප්‍රේමතිලක හා සිල්වා□1968:61) මැණික්දෙණ□ පුළුකුණාවේ□ සීගිරිය පර්වතය පාමුල විහාර□ පදවිය මොරගොඩ පෙන්වා දෙයි (බණ්ඩාරනායක□1974:73) මෙම විහාර වර්ගවල හදුනාගත හැකි පොදු වාස්තුවිද්‍යා ආරාමික ඉදිකිරීම් අංග ලෙස චෛත්‍ය□ බෝධිඝරය□ පොහොය ගෙය පෙන්වා දෙන අතර එම ලක්ෂණ සහිත විහාර පබ්බත විහාර බව ද පෙන්වා දෙයි (ජයවීර□2001:45)

අගනගරයේ හඳුනාගත් පබ්බත විහාර සංකීර්ණවල පොදු කරුණු ලෙස□ පූජනීය ගොඩනැගිලි□ පවුර□ දිය අගල□ ආවාස හා වෙනත් ඉදිකිරීම් රජගල පුරාවිද්‍යා පරිශ්‍රය තුළින් හඳුනාගැනීම වැදගත්යි මෙහිදී අධ්‍යයන ප්‍රදේශය තුළින් දිය අගල වෙනුවට පොදු ගොඩනැගිලි කලාපයත් දෙවන ආගමික කලාපයත් අතරින් පිටත ගලා යන ඇළ මාර්ගය හඳුනාගත හැකියි ආරාම පරිශ්‍රයේ පිහිටීම අනුව ස්වභාවික ඇළ මාර්ගයක් හෝ දිය අගලක් නිර්මාණය කිරීමට□ පාරිසරික හෝ භූගෝලීය පසුබිමක අවකාශයක් නොවන හෙයින් ප්‍රධාන ජල මූලාශ්‍රය වන වැවේ වාන් ජල හා අවට භූමිය කළමනාකරණය කිරීමෙන් රැස්වන ජලය ද එයට සම්බන්ධ කිරීමෙන් කෘත්‍රිම ඇළ මාර්ගයක් නිර්මාණය කරගෙන ඇති ලෙන් විහාරයක් ලෙස පැවැති අවධියේ භාවිත වූ ලෙන් පසු කාලීනව පබ්බත විහාරයක් ලෙස වර්ධනය වීමෙන් අනතුරුව ආවාස ලෙස භාවිත කිරීමත් ඒ ආශ්‍රිතව පසුකාලීනව වර්ධනය වූ නේවාසික ගොඩනැගිලි ද පබ්බත විහාරවල"ආවාස"ලෙස යොදා ගැනුණ බව හඳුනාගත හැකි වේ මුහුදු මට්ටමින් අඩි 1038 ක් අසින් යුතු රජගල ආරාම පරිශ්‍රය මස්තකයේ විවිධ භූවිසමතා ලක්ෂණ හඳුනාගත හැකි අතර□ මෙකී භූගෞලීය පිහිටීම නිසා ප්‍රාකාරයක අවශ්‍යතාව මතු නොවිණි එහෙත් පළමු ආගමික ගොඩනැගිලි සංකීර්ණය වටා මෙවැනි ප්‍රාකාරයක් හඳුනාගත හැකි වීමෙන් ඒ බව? පැහැදිලි වේ අනෙක් කලාපයන් ද ස්වභාවික පිහිටීම අනුව කඳු නිම්න දෙකක් අතර තැනි නිම්න ප්‍රදේශ කේන්ද්‍රකර ගනිමින් ව්‍යාප්ත විම හේතුවෙන් බාහිර කලාපයන්ගෙන් ස්වභාවික සීමා වීම සිදුව ලැබී ඇති බව තහවුරු වෙයි පූජනීය ගොඩනැගිලි ලෙස පළමු ආගමික කලාපයෙන් චෛත්‍ය දෙක□ බෝධිඝරය දැ□ දෙවන ආගමික ඉදිකිරීම් කලාපය තුළින් පිළිමගෙය□ බෝධිඝරය□ චෛත්‍ය දැ□ හදුනාගත හැකි අතර ආගමික කලාප දෙකටම පොදු වන පරිදි පොහොයගෙය පොදු ඉදිකිරීම් කලාපයේ හදුනාගත හැකි වේ මෙකී සාධක සලකා බැලීමේ දි රජගල පුරාවිද්‍යා පරිශ්‍රය පබ්බතවිහාර වර්ගය නියෝජනය කරන විහාරයක් බවට තර්ක කළ සිතිය හැකි වේ

## නව නිළධාරී මණ්ඩලයේ ප්‍රථම කාර්යය 2021 අප්‍රේල් 09 වන දින සම්මේලන මූලස්ථානයේ සාංඝික දානමය පිංකම








## මහාචාර්ය ගුණපාල මලලසේකර ශ්‍රී මතාණන්ගේ 48 වෙනි ගුණ සමරු උත්සවය 2021 අප්‍රේල් මස 23 වන දින












බොදු සමුළු නව නිලදරුවෝ මඩුල්ල දළදා වහන්සේ වැඳ පුදා ගනී 2021 අප්‍රේල් මස 24 දින













## බොදු සමුළු නව නිලදරු මඩුල්ල රාමඤ්ඤ මහා නිකායේ මහා නායක මාහිමිපාණන් වහන්සේ බැහැ දැකීම 2021 අප්‍රේල් මස 27 දින







## වෙසක් උත්සවය 2021













